THE SINHALA. P.22-23
The Sinhalese Cultural Forum
of NSW.
December 2014 (ISSN: 1834-7061)

# නොමැකෙන නත්තල් සිහිවටනයක්

'අම්මෙ මට නොවැම්බර් දහවෙනිදා ඉඳලා පත්වීම ලැබිලා තියෙනවා තුත්තිරියාගම ඉස්පිරිතාලෙට. මට වැඩ බලන්න දීලා තියෙනවා ඒ අවට ඉස්පිරිතාල තුනකම රජයේ සෞඛ්‍ය නිලධාරී විදියට' තැපෑලෙන් ලද රා.සේ.පි. ලියාපදිංචි ලිපිය කියවූ මාටින් කුරේ ඉහවහා යන සතුටින් සිය මවට කීවා.

'කොහේද පුතේ ඔය කියන ගම තියෙන්නේ?'

'අනුරාධපුරේ ඉඳලා තව හැතැප්ම විස්සක් විතර ඇතිනේ. පිටිසර ගමක්'.

'එතකොට උඹ ඉන්නේ?'

'ඉස්පිරිතාලෙ බංගලාවෙ. ගෙදර වැඩ කරන්න උයන්න කෙනෙක් දීලා තියෙනවා. මම නම් හරිම ආසයි ඒ වගේ ගමකට ගිහිල්ලා මිනිස්සුන්ට සේවය කරන්න. අනෙක රස්සාව පටන් ගන්න හොඳ පැත්ත.'

උපතින්ම ඉතා විනීත කතෝලික බැතිමතෙක් වූ මේරි නෝනාට තම පුතාට රජයේ උසස් රැකියාවක් ලැබීමේ සතුටත්, ඒ නිසා ඔහුගෙන් වෙන්වීමට සිදුවීමේ දුකත් සමගාමීව විඳ දරාගැනීමට ශක්තියක් තිබුනි.

ගෙදරින් පිට සිට නැති තම පුතා තනිවම නන්නාඳුනන පළාතකට යැවීමට මේරි නෝනාට හිත නොදෙයි. මාටින්ගේ විරුද්ධත්වයද නොතකා මාසයක් පමණ ඔහු සමග සිටීමට කැමති කරවා ගත්තේ අමාරුවෙන්. නත්තලත් ළඟ ළඟම එන නිසා හරියටම සති හතරකින් ඇය නැවත එන බවට පොරොන්දු විය. අම්මා අධෛර්යමත් කිරීමට නංගිලා ගැන කියූ දේත් අම්මා නොසලකා හැරියේ තම පුතා තනිවම යැවීමට ඇති බය නිසාය.

* * *

අම්මාගේ තනියට යාමට මාටින්ගේ සොයුරිය රොසලින් ද එකතු වුනා. දැන් ඔවුන් තුත්තිරියාගමට ගොස් සතියක් විතර ඇති. මාටින් රෝහලට ගිය පසු මේරි හා රොසලින් ගමේ ඇවිදීමට ගියේ කොළඹදී දැකිය නොහැකි මේ ගමේ අලංකාරය දැකීමට. රෝහල අසළ ඇති දිය ඇල්ලට යාමට රොසලින් නිතර ප්‍රිය කරයි. මෙසේ ඇවිදීමට යන විට මගදී හමුවන ගම් වැසියන් ඔවුනට ඉතා ගරු සරු කරයි. කොළඹදී මෙන් මිනිසුන් නිතර මුණ නොගැසුනත් මෙහි ඇති නිසල භාවයත්, කුඹුරු සිසාරා හමන මඳ සුළඟත් ගත සිත පුබුදුවයි. පසු කලෙක මෙහි පදිංචිවීමට රොසලින් සිතා ගත්තේ මෙහි සුන්දරත්වය සදාකාලිකව විඳ ගැනීමට.

'මේ දවස්වල නම් කොළඹ ඉන්න හැමෝම නත්තලට ලැහැස්ති වෙනවා ඇති. මේ පළාතෙ නම් ඒ ගැන පෙනෙන්න නැහැ.' නත්තල ගැන කතා කරන විට දෙදෙනාටම ගෙදර මතක් විය.

'තාත්තා නම් ගේ දොර හුණු ගාලා සුද්ද කරනවා කීවා. ඒත් අපි ගියාම නෑයන්ට අළුත් රෙදි ටිකක් ගන්න ඕන. කැවුම් කොකිස් ටිකක්වත් හදමු. හොඳ කේක් එකකුත් හදා ගනිමු' මේරි නෝනා කතා කළේ නත්තල ගැන ලොකු බලාපොරොත්තුවකින්.


එදාත් මේරි නෝනා හා රොසලින් නෝනා ගමේ ඇවිදින්න ගියේ පුරුද්දට වාගේ මාටින් කුරේ රෝහලට ගියාට පස්සේ. ආපසු එන ගමන් රෝහලේ අගුපිලේ වාඩි වී සිටින කාන්තාවක් ඔවුන් දුටුවා. ළඟට ගිය විට ඔවුන් දුටුවේ කිරිකැටි ළදරුවෙක් ගුලි කරගෙන මුහුණ ඔබාගෙන ඉන්න තරුණ ගැහැණියක්..

'උඹ මොකද මෙතන කරන්නේ මේ පොඩි නොදරුවත් එක්ක?'

දරුවාට කිරි පොවමින් සිටි කෙසඟ, එහෙත් පැහැපත් සිරුරක් ඇති ගැහැණියගේ ඇස් වලින් කඩා හැලෙන කඳුළු දුටු මේරි නෝනාගේ හිත උණු විය. ඇගේ හිස අත ගෑ මේරිනෝනා 'ඇයි උඹ මෙතන? ගෙදර යන්නෙ නැද්ද? කවදද මේ දරුවා ලැබුණේ?' යැයි විමසුවාය.

දරුවා දවස් තුනකට පෙර ලැබුණ බවත් දැන් හොඳ නිසා ටිකට් කපා ගෙදර යන්න කිවූ බවත් ඇය කීවේ හිස් අහස දෙස බලාගෙන.

'මොකක්ද උඹේ නම? ඉන්නෙ කොහේද? මම පුතාට කියලා උඹව ගෙදර බස්සන්නම්.'



තමාගේ නම යසෝහාමි බවත්, දරුවා සමග කුරුණෑගල සිටින සීලවතී අක්කාගේ ගෙදර යන බවත් කියා ඇය නැගිටීමට උත්සාහ කළා. එහෙත් යසෝහාමි දරුවා සමග නොවැටී බේරුනේ මේරි නෝනා සිටි බැවින්. මේරි නෝනා ඇයට කෑමට විස්කෝතු කිහිපයක් දී බීමට වතුර බෝතලයක් ද දුන්නා. ඇය මේරි නෝනට පින් දුන්නේ 'දැන් තමයි වතුර ටිකක් බිව්වෙ අද දවසටම.' කියමින්.

'කවුද මේ දරුවාගෙ තාත්තා?'

'මගෙ මාමගෙ පුතා. සෙනරත් මහත්තයා. එයා දැන් කසාදයක් බැඳලා නුවර පැත්තෙ ඉන්නවලු.'

'කියාපං මොකද උඹට උනේ කියලා' ඉතාමත් කරුණාවෙන් මේරි නෝනා ඇසුවා.

'නෝනා මම ඉස්සර ඉගෙන ගන්න හරිම දක්ෂයි. හැමදාම පංතියෙ පළවෙනියා. මම 11 වසරට ගියාම මගේ ටීචර්ලා කිව්වා මට වෛද්‍යවරියක් වෙන්න කියලා. මේක අහලා මගේ අම්මත් තාත්තත් හරියට සතුටු උනා. මට හැම දෙයක්ම දුන්නා ඉගෙන ගන්න. ඒත් බලන්න නෝනා මගේ කරුමේ.' කී ඇය දිගු සුසුමක් හෙළා වතුර උගුරක් බිව්වා. සුසුම් මැද යසෝහාමි තම කතාව කීමට උත්සාහ කරයි. එහෙත් වෙව්ලන ඇයගෙන් වචන පිටවෙන්නේ අමාරුවෙන්. සමහරක් තේරුම් ගන්නත් බැහැ.

'අනේ නෝනා දවසක් තාත්තා කුඹුරට ගිහිල්ලා එද්දි නයෙක් ගහලා. මාස ගානක් තාත්තා ඔත්පල වෙලා

හිටියා. ඒ අතර තුර අපේ කුඹුරු, ඉඩ-කඩම් ටික ටික විකිණෙන්න ගත්තා. තාත්තා ලෙඩ ඇඳේ ඉඳගෙනත් කිව්වේ 'දුවේ උඹ දොස්තර නෝනා කෙනෙක් වෙයන් කියලා. ඒත් ටික දවසකට පස්සේ මගේ ඒ රත්තරං තාත්තා ඇස් දෙක පියා ගත්තා. මගේ දොස්තර කෙනෙක් වෙන්න තිබුණ ආසාවයි, බලාපොරොත්තුවයි දෙකම තාත්තාත් සමගම භූමදාන කරන්න උනා.' යසෝ නැවතත් හඬයි.

ආදායමක් නැති නිසා පාසැල් යාම නැවතුන බවත්, සිය මැණියන් කඩයප්පන් හදා වියදම හොයා ගත් බවත් යසෝහාමි කීවේ හරිම දුකෙන්.

'දවසක් මාමා, අම්මගෙ එකම අයියා අපේ ගෙදර ඇවිත් කිව්වා එහේ ඇවිල්ල ඉන්න, මට ඉගෙන ගන්න උදව් කරන්නම් කියලා. මම ආයෙත් ඉස්කෝලෙ යන්න පටන් ගත්තා. ඒත් නැන්දා කැමති උනේ නැහැ මම ගෙදර ඇවිල්ලා පාඩම් කරනවාට. ගෙදර වැඩ ටික ටික මට කරන්න උනා. පංතියේ වැඩ අතපසු උනා. මම ආයෙමත් ඉස්කෝලෙ යාම නැවැත්තුවා.'

'එතකොට මාමාගෙ පුතා, සෙනරත් මහත්තයා වැඩ කළේ කොළඹ කන්තෝරුවක. මාසෙකට සැරයක් එයා ගෙදර එනවා. දවසක් මාමායි නැන්දයි නැති වෙලාවක මගේ ළඟට ඇවිල්ලා කිව්වා නංගි මම උඹට ආදරෙයි. මම උඹව කොළඹ එක්කන් යන්නම් කියලා. මමත් කැමති උනා. ඊට පස්සේ මාස ගණනක් අපි අඹු සැමියන් ලෙස හැසිරුනා.' මේරි නෝනාට ඇය කියන්නේ කුමක්දැයි වැටහිනි.

'මගේ බඩ ටික ටික ලොකු වෙන්න ගත්තා. නැන්දා ඇහුවා ඇයි කියලා. මම විස්තරේ කිව්වා. නැන්දාට තරහා ගිහිල්ලා මට හොඳටම ගැහුවා තෝ අපේ මූණෙ දැලි ගෑව කියලා. ඒත් මාමා නම් හරියට දුක් උනා. එයා දැනගත්තා ඇත්ත.'

'නැන්දා අම්මාට එන්න කියලා හොඳටෝම බැන්නා. මේකි මගේ කොල්ලව අල්ල ගන්න හදනවා කියා එදාම මට ගෙදරින් යන්න කිව්වා. නැන්දා කුස්සියට යනකම් ඉඳලා මාමා මගේ ළඟට ඇවිල්ලා රුපියල් සීයක් අතේ තිබ්බා. එයාගෙ ඇස්වල කඳුළු. වචනයක්වත් කීවෙ නැහැ.'

'ඉතිං උඹට අම්මා ළඟට යන්න පුළුවන්නේ.'

'අනේ නෝනා මගේ අම්මත් දැන් වයසයි. ආදායමක් නැහැ. නිතරම ලෙඩ ගානේ. ඉතිං මං කොහොමද මේ දරුවත් එක්ක එයා ළඟට යන්නේ?'

'මමත් ළමයි පස් දෙනෙක් ඉන්න අම්මා කෙනෙක්. ඒ නිසා මට උඹව මෙතන දාලා යන්න බැහැ. වරෙන් යන්න මාත් එක්ක අපේ බංගලාවට.' ඉතා කරුණාවෙන් ඒත් කඳුළු බේරෙන දෙනෙතින් මේරි නෝනා කීවා.

දවල් කෑමට ගෙදර ආ මාටින් කුරේට ගෙය තුලින් කුඩා දරුවකුගේ හැඬීමක් ඇසුණි. ඒ කවුදැයි විමසූ මාටින්ට මේරි නෝනා සියළු විස්තර පැවසුවා. ඒ ඇසූ මාටින් කුරේට හීන් දාඩිය දැම්මා. ඔහු පිලේ ඒ මේ අත ඇවිද්දෙ හිස ගිනි ගත්තකු මෙන්.

'පවුනේ පුතේ, එයාට යන්න එන්න තැනක් නැහැ. අපි කොළඹ යනකොට එක්කන් යමු. අපිත් එක්කම ඉන්න පුළුවන්නේ. ඔය කෑම ටිකක් දෙන එක එච්චර ලොකු දෙයක්යැයි අපිට? මේක අපට දෙවියන් වහන්සේගෙන් නත්තලට ලැබුණ තෑග්ගක් කියලා හිතමු.' සුරුවම ළඟට ගිය මේරි නෝනා යාඥා කළා ය.

තමන් හිතූ දෙයම කරන අම්මා ගැන දන්නා මාටින් කුරේ 'අම්මාගෙ කැමැත්තක්' කියා නිහඬ විය. ඊට පස්සේ යසෝහාමිත් පියදාසත් හැදුනේ ඒ කොළඹ ගෙදර. යසෝහාමි මේරි නෝනාට සැලකුවේ දෙවි කෙනෙක්ට වාගේ. විවාහයෙන් පසු මාටින් පදිංචි වූයේ කලුතර. කලුතර හා කොළඹ දිස්ත්‍රික්ක දෙකටම ප්‍රධාන සෞඛ්‍ය නිළධාරී නිසා ඔහු නිතර කොළඹ එයි. එක් දිනක් මාටින් කුරේ ගෙදර ආ විට අම්මා රහසින් 'බලපන් පුතේ. මේ යසෝහාමිට ආයෙත් දරුවෙක් ලැබෙන්න ඇවිල්ලා. අර කඩේ වැඩ කරන කරෝලිස්ලු තාත්තා. මං කරෝලිස්ගෙන් ඇහුවා. කරෝලිස් කැමතිලු මෙයාව කසාද බඳින්න.'

'එහෙනම් අද හෙටම මේක කරලා දාන්න අම්මේ'

අවාසනාවකට මෙන් දින කීපයකට පසු පාර පනිද්දි කාරයකට යට වූ කරෝලිස් මරුමුවට පත්විය. මෙය ඇසූ යසෝහාමි සිය දිවි නසා ගැනීමට කළ උත්සාහය මේරි නෝනා වැළැක්වීය.

'යසෝ මම මේ සැරෙත් උඹට සමාව දෙනවා. මේක තමයි අන්තිම වතාව.'

යසෝ මේරි නෝනාගේ දෙපතුල මත වැටී එය තෙත් වන තෙක්ම හැඬුවාය.

පියදාසගේ නැගෙණිය කරුණා දැන් අවුරුදු තුනක පමණ දඟකාර දැරියක්. ඉස්කෝලේ පහේ පංතියට පමණක් ගිය පියදාස අවුරුදු හය හතක්ම කඩේ වැඩ කරන්න පුරුදු උනා. ඔහු ගැන දුක් වූ හෙට්ටිගොඩ මාමා පියදාසට 'හාවා' බීම කොම්පැණියේ ස්ථිර රැකියාවක් ලබා දුන්නා. ඉන්පසු තම මවත් නැගෙනියත් සමග වෙන්වීමට සිතා සිටි පියදාසට ඉඩමක් හා ගෙයක් ගැනීමට මේරි නෝනා උදව් වුනා. පානදුර පැත්තෙන් විවාහයක් කර ගත් පියදාස දැන් ඉතා හොඳින් දිවි ගෙවයි.

කරුණා මැද පෙරදිග රැකියාවක් කොට පැමිණ විවාහයෙන් පසු දරු සුරතල් බලන අම්මා කෙනෙක් දැන්.මේරි නෝනා මිය ගොස් වසර ගණනාවක් වෙතත් යසෝහාමි තවමත් ඇය වෙනුවෙන් හැමදාම පහනක් දල්වන්නේ තමන්ගේ ජීවිතය ආලෝකමත් කළදෙවියෙක් ලෙස සලකමින්.

යසෝහාමිගේ වාසනාවන්ත වූ දිවිය දකින මාටින් කුරේ තමන්ගේ පළමු රැකියාවත්, තම මවගේ ස්ථිර අධිෂ්ඨානයත් සිහි කරන්නේ ඉතාම අභිමානයෙන්. මාටින්ට මෙය සීතල උඳුවප් මාසයේ නත්තල් සමයේ ඉතාම සැනසීම දෙන සිතුවිල්ලක්.

මිනිසුන් ඇත ලොව දෙවි-බඹුවරු විලසින්
අනුනගෙ දුක ගැන තම සිතනිති යොදමින්
තේජෝ බල ඇති දෙවිඳුනි ලොව සුපතන්
එම සුදනන් හට නිති ජය සැප ලැබ දෙන්!

**මහාචාර්ය ෂෙල්ටන් පීරිස්**
සිඩ්නි විශ්ව විද්‍යාලය